# ඔත්තුකාරයා.



H.K.D.W.M.M.K හපුහින්න.

# ඔත්තුකාරයා.

H.K.D.W.M.M.K හපුහින්න.

කතෘ

2025-02-08

# පිදුම.

මෙතුකී දුවට

සහ

විද්‍යාවේ ආශ්චර්යය තුලින් ලොව දකින දරුවනට ……………..

# පෙරවදන.

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

හිරු අවරට යනවාත් සමග වායුගෝලය සිසාරා පැතිර යන ලා තැඹිලි පාට වර්ණයෙන් හැඩවූ මනස්කාන්ත පරිසරයත් ගලා යන ජල පහරේ සීතලත් කුරුල්ලන් ගේ තොරතෝංචියක් නොමැතිව ඇසෙන කිචි බිචි හඬත් මාගේ දෙපා ඔසවීමට තරම් ශක්තිමත් නොවීය. තවත් ජලයේ කිමිදෙමින් අවරට යන හිරු දෙස බලා ලබන සැනසීමෙ උදම් වී තව තවත් ජලයේ පහස විඳිමින් සිටීමට සිතා ගනිමින් ජල පහරේ ඉදිරියටම ඇදුනෙමි.

ක්ෂණයකින් මගේ හිසමත වැරෙන් යමක් පතිත වූ අතර දිය යට කිමිදෙමින් සිටිමා අපහසුවෙන් හුස්ම අල්ලා ගෙන ඉහලට වේගයෙන් පීනුවෙමි.

නැවතත් හිසට වැරෙන් පහරක් එල්ල වීය. දෑත් දෙකම වැරෙන් ගසමින් ජල කඳ දෙබෑ කරමින් ඉහලට මතුවිය ……….

ඕ ......... පුටුවෙන් පෙරලී මා බිම වැටුණි. සිනා හඬ දසත පැතිරී ඇසෙද්දී මා දුටුවේ ස්ටීවන්සන් මහතා කෝපයෙන් තම උපැස් යුවල යටින් මාදෙස ඔරවමින් බලා සිටින බවයි. ඔහු ඉංග්‍රීසි බසින් යූ ……. අවුට් ….. අවුට් ….. යැයි යටි ගිරියෙන් කෑගැසීය

.

අමාරුවෙන් නැගිට ගත් මා අතට අසුවූ මාගේ බෑගය සමග ප්‍රධාන ශාලාවෙන් අඩියට දෙකට හූ හඬ මැද පිට උනා නොව මාගේ ශරීරය පාද විසින් විසිකරගත්තාක් බදු වීය. දේශන ශාලාවේ මාහට නින්දගොස් ඇතිවිට මා දැක්වූ චලන ඉවසාගත නොහැකිව දේශකතුමා දකී යන බිය නිසා මාගේ මිතුරා කිහිපවරක් මාගේ හිසට වැරෙන් පහර කිහිපයක් එල්ල කර ඇත.

නමුත් ආශවාදජනක සිතුවුලි වල ගිලී සිටි මාහට එම චමත් කාරයේ නිමග්න වී සිටි නිසා අත් ඔසවමින් දගලා මිතුරාගේ පහර සමග බිම ඇද වැටිනී. වූ ලජ්ජාව අතිමහත් ය.

ගොලුබෙල්ලෙක් මෙන් සෙමෙන් සෙමෙන් එළිමහනට පැමිණියෙමී. පෙරදින රවුම්ගසා රෑ බෝව් පැමිණීමේ එල විපාක අද මම අත්දැකී මී. නින්ද කෙනෙකුට කොපමන වටිද යන්න මට අවබෝධ වීය. කෙසේ වෙතත් මෙමෙ ප්‍රොජෙක්ට් නයිට් වැඩ සටහන මාගෙන් ගිලිහී යාමට නොදෙමි යන දැඩි අධිෂ්ඨානය ඇතිව මා ආපනශාලාව වෙත ගමන් කලෙමි. නමුත් පසුපස යමකු එනබව දැනී මාහැරී බැලුවෙමී නමුත් කිසිවකු නැත.

ආපනශාලාවේ ද කිසිවකු නොවු නිසා මා එහි කොනක වාඩිවී මාගේ අවසර පත භාවිතා කරමින් කෝපි කෝප්පයක් ඇනවුම් කලෙමි. කෝපි සුවඳ විදිමින් කෝපි කෝප්පයක රස විදිමින් මා වට පිට බැලුවේ නැවත මා දෙස යමකු විමසිලිමත් වේද යන්න බැලීමටයි. වටපිට බලමින් සිටිනවාට වඩා එක අරමුණකට සිත එක්තැන්කර ගැනීම වැදගත් නිසා මා අත වූ පොත ද දිග හැර ගතිමි. අමුතු සිතුවිලි මා වෙත ගලා එන්නට වීය. සිත කියන්නේම යමකු මා ලුහු බඳින බවයි. වටපිට බැලුව ද එක් පුද්ගලයකු හැර කිසිවකු නොවීය. නමුත් මගේ ඉව මට විශ්වාසය. මා සෙමෙන් ආපනශාලාවෙන් පිටතට ආවෙමී. පඩිපෙළ දිගේ මා බසිනවිට තව කෙකු මාපසු කර ඉහළ නගින්නට වීය. එ සමගම දඩස් හඩින් පොත් කිහිපයක්ම බිම වැටිණී .

 'ඔහ් ………………. පොත් ' මා නැවී පොත් ඇහින්දෙමි " ඕ …….. අයිම් සොරි"

"දෝස් බුක්ස් ආ මයින් ".

කියමින් මා දෙන්නත් පෙර පොත් උදුරා ගනිමින් "තෑන්ක්යූ ". "තෑන්ක්යූ" .

කියමින් දිව යන ලදී. පිටතට පිවිසුම වෙත ආ මා ප්‍රවේශ පත්‍රය ගැනීමට මාගේ කබායට අත දැම්මි . "ඕ විට් ඊස් දිස් ? මට කියැවිණ. කාන්දිමක් වැනි යමක් අතට ඇදී ආවේය. මා එය ඉවත් කිරීමට තැත් කලත් නැවතත් අතටම ආවේය. මෙය මට අයිති දෙයක් නොවන බැවින් එය කුණු බදුනට විසිකිරීමට උත්සහ කලත් නැවත මා වෙතම ආවේ මාගේ කෝඩ් අංකයට එවීමක් ලෙස සටහන් වු බැවින් මා හැකි

ඉක්මනින් මය පරීක්ෂා කිරීම සඳහා කුතුහලයෙන් යුතුව මාගේ නවාතැන වෙත ගමන් කෙරුවෙමි.

මාගේ දෑස් අදහාගත නොහැකි විය. හුස්ම නතර වේ දැයි මා මා පපුව අල්ලා ගෙන කල්පනා කෙරුවෙමි. " මේ කුමක්ද ................? " මනස අවුලෙන් අවුලට පත්විය .මා වැටුනු අමාරුවක තරම වැටහුනී . සිහි එලවා ගත නොහැකිව මා ඇඳට පැන්නෙමි .

" ට්‍රිං ට්‍රිං ට්‍රිං ට්‍රිං"

දුරකථන නාදය සමග මා අවදිවිය. " ඕ මයි ගෝඩ්" පසුදින අටත් පසුවී ඇත. "මෙච්චර වෙලා ..........................................".

ඉවරයි මම අදත් ඉවරයි . දුර කථනය නැවත නාදවීය. "ඕයි තමුසේ කොහෙද"?

"මෙහෙ එනවා"

.දුරකථනයෙන් විසන්දි විය. හැකි ඉක්මනින් දත කට මැද ගත් මා කාරය පන ගන්වා එක් අතකින් මාහේ ඇදුම සකසා ගනිමින් අවදානම් ගමනකට මුලපිරීමි .

එලෙසම කෝපි කෝප්පයද ඇනවුම් කලෙමි .පර්යේෂණාගාරය වෙත දිවගිය මා දුටුවේ දේශනය ආරම්භ වී සුළු මොහොතකුත් ගතවී තිබු බවයි . මා පසුපස අසුනේ මුල්ලේ හිදගත්තේ ගුලට ඇදෙන නයකු මෙනි .පෙර දින සිදුවීම නිසා හිස එසවීමට නොහැකි ලජ්ජා සහගත බවක් මතුල තිබිණි. සෙමෙන් හිස ඔසවනවිට මා ලග අසුනේ උන් වුන් මාදෙස බලා ඉගි මරමින් සිනා සෙනු දුටිමි. ස්ටීවන්සන් මහතා වාක්‍ය අවසන් කර උපැස් යුවල යිටින් බලා මාගේ නම පවසා කෝ ඉන්නවා දැයි ඇසීය.

මම අත ඔසවා ඉන්නවා යැයි පැවසීමි. අනෙකුන් මට සිනා සුනෝය. " යූ කම් අවුට් " යැයි පවසමින් දේශනය අවසන් කරන ලදී . මා ද දේශන ශාලාවෙන් පිට වූ නෙමි.

ස්ටිවන්සන් මහතා සිටින තැන මා සොයාගත යුතුයි. ආරක්ෂකයා ගෙන් තොරතුරු ලබාගත් මා සෝපානයට නැග තිස් වෙනි මහල දක්වා ගමන් කෙලෙමි. සෝපානයෙන් බැස ඉදිරියට ගොස් දකුණට හැරුණෙමි. "  ස්ටිවන්සන් මහතා " ලෙස ඇතුල් වන ස්ථානයේ නම සටහන් විය.  ගැඹුරු හුස්මක් ගත් මා ස්ටිවන්සන් මහතාගේ කුටි ය ඉදිරියේ ඇති ස්කෑනර් යන්ත්‍රය අසල හිටගතිමි  දොර විවර වීය. මා ඇතුල් වීමි . එහිදී පහලට යන සෝපානයට ගොඩවීමට මට අණ ලැබිණි.

මා පහලට ගමන් කෙලෙමී. පහල දුටු දසුන් ආකර්ශනීය වීය. පහල තනිකරම පාරාදීසයකි විශාල ශාක සතුන් ගංගා පසු කරමින් මා ගමන්කලේ පොලව අභ්‍යන්තරයේ මෙවැනි නිර්මාණ කිරීමට මිනිසා තාක්ෂණය අතින් කෙතරම් දියුනුද යන්න සිතින් උදම් අනමිණී .

මාසෝපානයෙන් බැස ඉදිරියට ගමන් කලෙමි සුරංගනා කතාව ල පාරාදීසය මෙහෙම වෙන්න ඇතියි මට සිතුනි.

ස්ටිවන්සන් මහතා කුරුල්ලන්ට කෑම දමමින් සිටිනු දුටිමි. මා පියවි සිහියට ආවෙමී.
"ස .........සර්"  "සර්" මා ගොත ගැසීමි  "ආ "

"තමුසේ   ආවද ?"......................දැකලා තියෙනවද මේ වගේ තැනක් ?

"නෑ සර් " මම කිව්වෙමි    "මේවා නිකන් ලැබෙන්නෑ"  "මහන්සියේ ප්‍රතිඵල "තේරුණා  ද ? ................."  "ඔව්"  "ඔව් සර් " මම ගොත ගැසීමි.

" එන්න "  යැයි පවසමින් පඳුරු තුලින් ඉදිරියට මා කැඳවා ගෙන යන ලදී . එහිදී අපූරු පොකුණක් දිස්විය.  " බලනවා මොනවද පේන්නේ කියලා "  ඔහු පවසන ලදී මම පොකුණ දෙස බැලීමි.  මම දුටුවේ මාලුය . මම   " මාලු " මාලු " යැයි කීවෙමී.

" අයිසේ මාලු මටත් පේනවා"  "වෙන මොනවද පෙනෙන්නේ ? "

"මි"...........''මි"   මට නම් කිසිවක් නොපෙනුන අතර සිතුවිලි අතර සිරවි ය " අයිසේ  මාලුවන්ගේ ඇස් බලනවා "

“ ඕ මයි ගෝඩ් “ මා උඩ ගියා වැනි හැඟීමක් ඇති විය මාලු එක වර්ගයේ උවද ඔවුන්ගේ ඇස් කොළ සහ නිල් පාට වීය එම ඇස් වටා කහ පාට වලල්ලක් වීය.

“හා“ “හා“ ඔය ඇරුණු කට වහගන්නවා “ “සත්තු රිංගයි“ යැයි ස්ටීවන්සන් මහතා කොක් හඩලා සිනා විය ඒ සමගම ගස් අතරින් පැමිණි පුද්ගලයකු යම් පනිවිඩයක් ස්ටීවන්සන් මගතාට පැවසීය . සැනින් ඔහු පණිවිඩ කරු සමග ගස් තුලින් නොපෙනී යන ලදී. දෙලොවක අතරමංව සිටි මා මාලුවන්ගේ නිරීක්ෂණ සටහන් කර ගතිමි නිල් ඇස් කොළ ඇස් වලට අමතරව තැඹිලි පාට කහ පාට රැස් වලල්ල මම සටහන් කරගතිමි . එහෙනම් වැඩේ හරි . මේ සියල්ලම එහි ප්‍රතිඵලයක් කෙසේ වෙතත් මා වෙත පැවරූ කාර්යය නිසි ලෙස ඉටු කිරීමට මා බැදී සිටියි ඒ සඳහා මා කැපවිය යුතුය කෙසේ හෝ තොරතුරු රැස් කිරීම කල යුතුය. අද දින දේශනය සවස් වරුවේ බැවින් මෙහිම රැඳීමට ඉටා ගත්තෙමි. හමුවන සෑම සතකුම නිරීක්ෂණය කර සටහන් කරගතිමි . නමුත් යම් පුද්ගලයකු පැමිණ ඔහු පසුපස එන්නැයි දැනුම් දෙන ලදී. ඔහුගේ ඇස් ………… ඒ ඇසුත් මාලුවන්ගේ මෙනි .

එදෙස ඍජුව බැලීමට පවා අපහසු දනවන්නකි මා ඔහු පසුපස ගමන් කළෙමි .විශාල වෘක්ෂයක් ලගට ගමන් කළ ඔහු අවසර පත ඇතුල් කළ විට දොරක් විවර විය. මා එය තුළට ගියෙමි. එහි සෝපානය අප ඉහලට මාලයට රැගෙන යන ලදී. එහි අංක එකසිය හැට අට විය. මම යන විට ස්ටිවන්සන් මහතා සමග තවත් පුද්ගලයකු කතා කරමින් සිටි අතර එතැනට එන ලෙස මට අතින් සංඥා කරන ලදී.

“ මෙයාද………………? “ මේ හාදයා………………. “ඊ පැවසූ අනික් පුද්ගලයා අතනින් වාඩිවෙන්නයි සංඥා කරන ලදී හඳුනා ගැනීම සතුටක්

“ ඔයාට ටාගට් ඇච්චි චීචි කරන්න දුන්නොත් පුළුවනිද ? මම ඍජුව ඔහු දෙස බැලුවෙ මි.

“ නෑ කමක් නෑ“ අකමැති නම්

“ නමුත් මම කියන්නේ මේ වැඩේට ගැලපෙන්නෙ ඔයා කියලයි“……………………… මම හිතන්නේ“

“ මොකද ඔයාට ටාගට් ඇච්චි කරන්න කරන්න හොඳ හිස්ට්‍රියක් තියෙනවා කියලයි. මම හිතන්නේ “

“හොඳයි. “

“ මම කල්පනා කරලා අදහසක් දෙන්නම්. මම පැවසීමි “

කෙසේ හෝ ඇතුලට යාගත හැකි පොටික් පෑදීම මට ඉතා සතුට ජනක කාරණාවක් වීය. මා නවාතැනට පැමිණියේ ඉතා සතුටිනී දොරට අත තබනවත් සමග එය විවරවිය කවුරුන් හෝ මාගේ කාමරයේ සිටින බව මට හැගුණු නිසා ජනලින් පිටත පැත්තේ මා සැදූ රහස් මාර්ගයෙන් ගෙට ඇතුළු වීමට සිතා ගෙන සෙමෙන් ජනෙල්ලෙන් පැමිණ මගේ රහස් මාර්ගයට පිවිසුනෙමි. තරමක් කරුවල වුවද මගේ කාමරයේ යමකු සිටිනා බව මට කළුවර තුළින් යන්තමට දිස්විය මට පිටුපා මාගේ ලාච්චු අදිමින් සිටි ඔහු එකවරම මා අල්ලා ගත්තේ ඉදිරියට පනිමිණි.

වැරෙන් මගේ යටි බඩට පහරක් එල්ල විය මා බිම පෙරළී ගියෙමි ඔහුගේ කකුල් පහරත් සමගම මා ඔහුගේ කකුල අල්ලා ගතෙමි. ඔහුද පෙරළී නැවත මට පහර ගැසීය මාද පෙරළා පහරදුනි මි අනපේක්ෂිත පහරෙන් කැරකී ගියාය ඔහු කැරකී මේසේ කොන හිසේ වැදී පෙරළී ගොස් පුටුවේ වැදී නතර විය මා ළගට ගියත් ඔහු නිසොල්මන්ය මම හැකි ඉක්මනින් ඔහු පුටුවක හිඳවා දෙයත් සහ පාද ගැට ගැසීමි , කාමරයේ බල්බය පත්තු කෙරෙමි මා දුටුවේ අවුල් ජාලයක් කර ඇති මගේ කාමරයයි. මේ මිනිහා ලච්චාම අස්කරනවා. යයි මට සිතුනි. මම ඔහුගේ මුඛ ආවරණය ගැලවීමට හිතා ගතිමි. මුවාවරණය ගැලවීමි මගේ දෑස් අදහා ගත නොහැකි විය ඒ කාන්තාවකි. ඈය ඉතා ශක්තිමත් දක්ෂ සටන් ශිල්පිනියකි. නමුත් මගේ කෝපය පාලනය කරගත නොහැකිවූ මා දැඩි සැරෙන් කම්මුලට පහරක් එල්ල කලෙමි. ඒ සමගම සිහි එලවා ගත් ඇය කිසිවක් නොකියමින් සෙමෙන් මුදාහළ අතින් මගේ ගෙලට වැරෙන් පහරක් එල්ල කළේය නමුත් පහර වැදී ඇගේ අත

අතෑරුනෙන් කැරකී ගොස් මා බිම හිඳවුණි නමුත් නැවත ඇගේ පාදයෙන් ඇද ඇය බිම පෙරළා ගතිමි. පුටුව සමග පෙරලුණ ඇය කෙඳිරි ගානවා ඇසුණි.

" කතා කරනවා තමුන් මෙහෙම කළේ ඇයි ......................?" .

ඉවත බලාගෙන සිටි ඇයට මා යළිත් පහරක් එල්ල කලෙමි. එවිට ඇගේ මුව විවරවිය.

" චිප් ................චිප් " යයි පැවසී ය .

මුව විවර කළ ඇගේ මුවින් ලේ ධාරාවක් පිට විය. එය සමගම ගැඹුරු කැස්සක් එන ලදී .මා වතුර වීදුරක් ගෙන මුහුදට හැලීමේ , සැකයෙන් හිස ඔසවා බැලූ ඇය මට හඳුනාගත හැකි විය ඒ එදා මගේ ඇඟේ හැපුණු ඇයයි .

" තමුසේ .......................තමුසේ." මම කෑගැසුවෙමී .

" මම දන්නවා තමුසේ කවුද කියලා ".

" මොකද මෙහෙම කරන්නේ?" මම ඇසීමි. දැන් කියනවා .

මා අතට කුඩා ස්ටූල් එකක් ගත්තෙමී . ඇය සිතුවේ ඇයට පහර දෙන්න යනුවෙනි.

" ඒ නිසා මම කියන්නම්..........................". යැයි පැවසීය.

" අර චිප් එක මට දෙනවා.........................." ඇය කෑ ගැසීය .

" මොන චිප් එකද මම ඇසීමි ? ".

" එදා මට ඇගේ හැපුණු වෙලේ ඔයාගේ බෑග් එකට දැම්මේ................."

එතකොට මට මතක් උනේ එහෙනම් චුවමනා වෙන්මයි මේක කරලා තියෙන්නේ.

" කෝ ඒක මට ඕනේ". ඇය සැරෙන් පැවසීය.

" හරි දෙන්නම්. තමුසෙට කොහෙන්ද ඒක ? "

" ඒකටත් වඩා ඇයි මගේ බෑග් එකට දැම්මේ. මම කෝපයෙන් කෑ ගැසෙමි".

" කියන්නම්""කියන්නම්. අහනවා" .

" හරි අපි කතා කරමු" යැයි මා පැවසීමි.

කෝපය සඟවා ගනිමින් ඒත් මේ මොන මරාලයක්දැයි මම හිතින් සිතමින් මාද පුටුවක හිඳගතිමි හරි මමත් ඔයා වගේම මේ මෙහෙයුමට සම්බන්ධයි.

"ඔයාගේ ආරක්ෂාවට …………….. " මගේ ආරක්ෂාවට මා පුදුම වූයෙමි

" බොරු කියන්න එපා. "

නෑ එහෙම මනෙමෙයි. ඔය අසාර්ථක වුණොත් මම තමයි ඊලග ඔප්ෂන් එක

" මොකක් තමුසෙ බොරු කියන්නේ ………………….."

" ඇයි මම බොරු කියන්නේ?" " මේ තියෙන්නේ ………………".

ඇගේ දකුණු අත මත පෙන්වීය එහි නිල්පාට මගේ සංවේදන උපකරණයට සමාන එකක් විය.

" බෑ ……………….."

" මට පිළිගන්න බෑ" .

" තව සාක්ෂි ඕනේ ……………….. "

" මම කෑ ගැසීමි" . "හරි ………ආ ………… මෙන්න" ඇය දකුණු අතේ මාපට ඇඟිල්ල දික්කර දත්ත විවර කර ඇගේ තොරතුරු මාහට පෙන්වන ලදී එය සත්‍යයකි. මා ඇගේ ගැටය ලිහා ඇයට බිමට වතුර බෝතලයක් දුන්නෙමි

" හරි කතා කරමු." යැයි පවසමින් දත්ත සමූහය මේසය මත තැබීමි .

" මොනා කතා කරන්නද ? "

"ඕක දෙන්න මම යනවා ………………….. "

" මගේ රාජකාරිය මම කරන්නේ ………………"

“ හරි මට මේක කියන්න ඇයි මිනිස්සු මේ වගේ වැඩ කරන්නේ ?. ඒක උන්ගෙන්ම අහ ගනින් යයි “.........................පවසමින් දත්ත තැටියට ගත් ඇය මගේ ග්‍රහනයෙන් මිදී පලා යනලදී . නමුත් පිටපතක් මා සතුය එය ඈ නොදන්නා බැවින් මට පොඩි හිනාවක් නැගිනි

සවස් වන තුරු කාමරය ඇයට බනිමින් අස් කලෙමි.

නැවත සූදානම් වූ මා ප්‍රොෆෙසර් හමුවීමට ගමන් කළෙමි .

“හා මිත්‍රයා ..................“ යැයි පවසමින් මාව ඔහුගේ කාමයට කැඳවිය. “ඔයාගෙන් වැදගත් වැඩක් කර ගන්න අපට අවශ්‍යයි. හැබැයි රහසක් ............................“

“හොඳයි පුළුවන් දෙයක් නම් කරන්නම්“ යැයි මා පැවසීමි. “ඔයාව මම හම්බවෙන්නම්. පෞද්ගලිකව....... ““පෞද්ගලිකව ඔව්...............“

“ ඔව් පෞද්ගලිකව ........................“...දැන් යන්න“ යැයි පවසා දොර දෙසට යන ලෙස ට සංඥා කරන ලදී. මම දොරෙන් පිටවී මගේ කාර්යය පැවරූ ස්ථානයට ආවෙමි.

මට පැවරුණේ නව ජීවීන් ලේබල් කිරීමයි. නවජීවීන් යනු ක්ලෝනීකරණය සාර්ථක වූ ජීවීන්ය අද මට ලැබුණේ හාවුන් සමූහයකි මා ඔවුන් ලේබල් කළ පසු මීවන ශාක සමූහයක් ලේබල් කරන ලෙස අනලැබුණි මේ වන ශාකලේබල් කළ පසු මගේ සේවා මුරය අවසන් විය අවන්හල පැත්තට යා යුතුයි සිතූමා ඒ දෙසට ගමන් කලෙමි. ආරක්ෂක නලාව නාද වූයෙන් සියලු දෙනාගේ අවධානය යොමුවිය ආරක්ෂ නිලධාරීන් අසුවුවහොත් හෝ ජීවිතය නැති වන බැවින් කිසිවෙකු වරදක් කිරීමට හීනෙන්වත් හිතන්නේ නැත මාද ඒ දෙසට දෙසට අවධානය යොමු කලෙමි අහෝ ඒ ප්‍රොෆෙසර් ළඟ සිටි ඔහුගේ උපකාරයකට සිටි අංක 422 දරන පුද්ගලයායි මොහුට අත්වන ඉර නම සිතමින් මාගේ කෝපි කෝප්පයක රස බැලීමට සිතා ගතිමි මටද එක පියවරක්වත් වැරදුවොත් ඔය ඉරනමමය සිතුවාටත් වඩා කාලයක් ගත වූ බැවින් මා මාගේ නවාතැන වෙත පැමිණියෙමි. රාත්‍රිය 11ට පමණ මගේ නිඳන

කාමරයේ ජනේලයට එළියෙන් ටොක් ටොක් ශබ්දයකින් යමක් වැදෙන හඬින් ඇහැරුනෙමි. ෂුවර් එකට මට යමක් දැනුම් දීමට මාගේ ආයතනයෙන් පණිවිඩයක් යැයි මට සිතුණි. මා සෙමින් ජනේලයෙන් පහළ සිටියේ කළු කබායක් ඇඳගත් අපේ ප්‍රොෆෙසර්ය. මා ඉදිරිපසින් එන ලෙස සංඥා කරමි. ආලෝකය දැල්වීමට එපා ලෙස පවස මට සංඥා කරන ලදී. මා ඉදිරිපස දොර විවර කලෙමි. යහු සුළුව ඇතුලට ආ ඔහු පැවසුවේ මගේ උත්සාහය හැම දෙයක්ම විනාශයි.

“ කමක් නැහැ “ඔයා තමයි මගේ එකම බලාපොරොත්තුව……………“

“සර් ඇයි කියන්න මොකද උනේ?“

“ඔයා දන්නවානේ මෙහි නීති ………………………“

“වැරැද්දක් වුණොත් අපේ ජීවිතය නැතිවෙනවා“. “ඒක ඔයා දන්නවා නේද ? “

“ ඔවු සර් “…………“මම ගොතගැසීමි “.

“ දැන් මේ වැරැද්ද වෙලා“

මම විරුද්ධ උනා මිනිසුන් ක්ලෝන් කරනවට ඒකට මට දෙන දඬුවම දන්නවනේ මගේ පර්යේෂණය සාර්ථක වුණා. ඔයා ඒ බීජ විනාශ කරන්න ඕනේ. කොහොම හරි . තව මිනිත්තුවක්වත් මම හිටියොත් ඔයත් අමාරුවේ. මම ජනෙල්ලෙන් පැනලා යන්නම්. ජනෙලය වහගන්න සමහරවිට ඔයාව දකින අවසාන අවස්ථා මේක වෙන්න ඇති.

මම නිරුත්තර වීමේ වචන මගින් මුවින් පිට නොවුනත් දහසක් යනතුර මා බලා සිටිමි , නැවත නින්දක් මා අසලටවත් ආවේ නැත මා ප්‍රොෆෙසර් එකේ දත්ත ගබඩාව එකින් එක විවෘත කර කියවීම හෝ අපරාධයක තරම ඒ සමග මා හට කුමක් වුවත් පාන්දර තුනයි හතළිස් පහට විතර ලැබුණු රහස් පණිවිඩය නිසා රහස් කුටියට ගියෙමි එහිදී දැනුම් දුන්නෙ ප්‍රොෆෙසර් මට දුන් පණිවිඩයමයි මා හට දුන් නියෝගය ක්‍රියාත්මක කිරීම මගේ වගකීම බව මට පසක් විය

පසුදින සුපුරුදු පරිදි මගේ රාජකාරියට ගියෙමි. කිසිදු අමුත්තක් නොපෙන්නූ මා සාමාන්‍ය පරිද කටයුතු කිරීමට සිතා ගතෙමි. නමුත් හදිස්සියේ අප පස්දෙනකු කැඳවීම් කරන ලදී අපි කැඳවීම අනුව කටයුතු කළෙම ප්‍රධාන ශාලාවට ගමන් කළා අපි පුටුවල වාඩිවන ලෙස අතර අපි පස්සනා සඳහා ආරක්ෂක අංශයෙන් පස්දෙනෙකු යොදවා තිබිණි. අපගෙන් ප්‍රකාශ සටහන් කරගත් පසුව ඔවුන් ාඩි දහයක කාලයක් රැඳී සිටින සේ යනකන ලදී විනාඩි දහයකට පසු මගේ සහ තවත් දෙදෙනෙකුගේ ප්‍රකාශ පරස්පර බැවින් නැවත ප්‍රකාශ සටන් කිරීම සිදුනි නමුත් හදිසියේම මා ඉවත් කළ අතර අනෙක් දෙදෙනා ප්‍රකාශ වීම නැවත සිදුකරන ලදී මා නැවත මගේ රාජකාරියට වාර්තා කළ අතර ඉවසල වැඩ අවසන් කැළඹී මීළඟට මගේ මෙහෙයුම ඔව් මම කොහොමහරි අපේ ලෝකයේ අනාගතය ආරක්ෂා කරන්න ඕනේ අනිවාර්යයෙන්ම කිසි හෝ නැවත මා භූගත පර්යේෂණාගාරයට යා යුතුයි. ප්‍රොෆෙසර් සිටි තැන සොයාගැනීම අනිවාර්යෙන්ම කළ යුතුයි. එසේ සිතුවම ප්‍රධාන ආරක්ෂක කුටිය වෙතැයි ආමේන්! මට ඉහළ නිලධාරක හමුවීමට අවශ්‍ය බැවින් ප්‍රකාශ කළෙමි. එවිට මා හොඳින් පරීක්ෂා කර කාමරයක් පෙන්වා එහි රැඳී සිට ලෙස දන්වන ලදී. මා එහි රැඳී සිටි ඉහළ නිලධාරී ජේ.අයි මහතා මා වෙත පැමිණ ඇයි ඔබට මා හමුවීමට අවශ්‍ය යැයි පැවසීය

'' මට රාජකාරී අඩුයි'' , ''ඉහල අංශයේ සිට පහල අංශයට මා මාරු කරා''

''ඇයි ?………………ඒ අනිත් අය ගොඩක් වේලා වැඩ කරනවා නේද ?

'' මගේ සේවා මුරේ දික්කරන්න බැරිද ? '' මම ඇසීමි

'' හොඳ ප්‍රශ්නයක් යැයි '' ඔහු පැවසුවේ සිනාවෙන්ය

''හොඳයි ඔබට කුමන අංශයද වඩා අවශ්‍ය ? ''

''ශාකාංශය හොඳයි. සත්ත්වංශයට වඩා'' මම පැවසී මි

ඔහු මා දස සෘජු ව බලා ''ඉතින් ඔබ ශාක අංශයයේමනේ වැඩ කරන්නේ පැවසීය''

'' නෑ එහෙම නෙමෙයි. ශාකාංශයේම විතරක් ලෙස මා පැවසීමි''

"එහෙම දෙන්න අවසර නෑ. හැමෝම අංශ දෙකේම වැඩ කරන්න ඕනේ. "

" ඒකනේ මම ඇනිමල් එකේ වැඩ කරන්න. "

" ඒක හොඳයි. එහෙනම් අපි සාකච්ඡා කරලා තීරණයක් දෙන්නම්. "

මෙසේ පැවසූ ඔහු නික්ම යන ලදී මා නැවත මගේ සේවස්ථානයට ආවෙමි. කෙසේ හෝ අවස්ථාව උදාකර ගනිමින් මා සිතුවෙමි හදිසියේම මගේ සගයෙක් අසනිප විය ඔහු හිටිහැටියේම අසනීප වූ බැවින් එය මට සැක සහිත විය ඔහු අසනීප වී දින දෙකකින් තවත් සගයෙක් අසනීප විය ඔහුද එකම කණ්ඩායමේය මාත් කොයි වෙලේ හෝ අසනීප වේ යයි බිය මට ඇතිවිය. ඒ නිසා මා කන බොන දේ ගැන සැලකිලිමත් වීමි. හැකි හැම විටම නිරාහාරව සිටීමට ආයතනය තුළ සිට ආහාර ගෙන්වා ගැනීමට උත්සාහ කිරීමත් මට කරන්න සිදුවිය පළමු සගයා ආහාර විෂ වීමෙන් අසනීප වූ බව රහස් තොරතුරු මගින් මා හට දැනගන්නට ලැබුණි. නමුත් දින දෙකකට පසුව දැනගන්න ලැබුණේ තවත් අයගේ විෂ ශරීර ගත වීමෙන් අසනීප වූ බවයි මාද කෙසේ හෝ අසනීප වීමට සිදුවේ යැයි සිතූ නිසා බිය වීමි ඒ නිසා උපරිම පරිස්සම් වීමට වගබලා ගනිමින් කටයුතු කිරීමට සිතා ගතිමි.

හදිසියේම මා නොහඳුනු පුද්ගලික මා ඉදිරිපිට විය ඔහු පැවසුවේ හෙට දිනා ආහාර හෝ වෙනයම් දෙයක් නොගන්නා බව සහ හෙට කිසිම පොදු ස්තානයක රැඳී සිටීමට කටයුතු නොකළ යුතු බවයි. මා එනිසාම බොරු ලෙඩක් හදාගනිමින් මා දසනීපව බව ආයතනයට දැනුම් දුනිමි. දැනුම්දී කාමරයට වී සිටිමි. මා පැවසුවේ බෝවන වෛරස් රෝගයක් බවයි. ඒ නිසා කවුරුන් මා සොයා නොපැමිණේ යැයි සිතූ බැවින් මා එසේ පැවසුවෙමි. මේ හොඳ අවස්ථාවක් බැවින් මා ද අසනීපයෙන් සිටින සේ රඟපෑවෙමි දුරකථනය නාද වෙයි.

මාහට දුරකතන ඇමතුමක් ආයතනයෙන් ලැබුණි අනෙක් පැත්තේ සිටි පුද්ගලයා ඔබට අවශ්‍ය පහසුකම් සැලසීමට අපේ පුද්ගලයෝ එවනවා ඇත ඔහුගෙන් අවශ්‍ය උපදෙස් ගන්නා ලෙස දැන්වීය මට උපකාර අවශ්‍ය නැති බවත් මා කෙසේ හෝ සියලු දේ කළමනාකරණය කරගන්නා බවත් මා පැවසීමි නමුත් ඔවුන්ගේ ක්‍රියාවලිය පිළිපැදිය යුතු බව දැනුම් දෙන ලදී මාහේ තත්ත්වය නිරීක්ෂණය සඳහා

ආරක්ෂකයකු රැදවීය නමුත් බොරු ලෙඩ අස්සේ මාහේ කාර්යය කිරීමට සූදානම් විය  නිදි බව හැඟවීමට අමාරු බවත් ඇවිදීමට අපහසු බවත් ආරක්ෂකයාට පෙන්වීමට විවිධ රඟපෑම් කිරීමට හිතා ගතිමි. මා සියලු විදුලි බල්බ නිවා දමා ඇඳට වි  කල් තියා ඇඳ යට සාදා තිබූ මගේ අනුරුව ඇඳේ තබා නිදි බව පෙනෙන සේ සැකසීමි. පැය පහක හයක දිගු නින්දක් අවශ්‍ය බව ආරක්ෂාට පැවසූ මා මොනම හේතුව කරත් මා ඇහැරීම නොකල  යුතු බව දැන්වූයෙමි. සෙල් පෝනෙද ක්‍රියා විරහිතකර මේසෙමත තැබීමි

 මගේ මෙහෙයුම් කට්ටලය ඇඳගෙන ජනේලයේ ආධාරයෙන් පිටතට පැනීණියෙමි කෙසේ හෝ මගේ අරමුණ ඉටු කර ගනිමින් මාර්ගය පෙන්වන සංඥා පද්ධතිය මුදා හැරීම් දැඩි උත්සහයකින් පසු හෝ ලබා දුන් පිවිසුමුම්  යතුරු භාවිතා කරමින් ප්‍රොෆෙසර්ගේද කුටියට පිවිසුනෙමි.

ආරක්ෂකයා රවටා  කුටියට පිවිසීමට හැකිවීම මා ළත් ජයග්‍රහණයකි පැවසූ පරිදි ආයතනයේ ඔක්සිජන් ඉවත් කර නව ජීවීන්  මියැදෙන්නට සැලැස්සුවෙමි. කෙසේ හෝ ජීවීන්  විනාශ කළ යුතුයි ඩී  එන් ඒ විනාශ කළ මා ඩී එන් ඒ අණු  විනාශ කලෙමි. පරිගණක පද්ධතිය මකා දැමුවේ වෙනත් ඇඟිලි සලකුණු සහිත අත්වැසින් යොදා ගනිමිනි. කෙසේ වෙතත් පැය හයක  වැඩේ පැය හතරකින් ඉවර කිරීමට හැකි විය .

මා හැකි ඉක්මනින් එතනින් පිටවීමි නමුත් මායන විට  මගේ කාමරය වටලා දොරට තට්ටු කරමින් සිටියේ වසංගත මර්ධන ඒකකයයි.  මගේ ආරක්ෂකයා සමඟ සාකච්ඡාවක තවකෙකු  විය .

හැකි ඉක්මනින් කෙසේ හෝ මගේ කාමරයට යා යුතුය. නමුත් ඒ කළ නොහැකි බැවින් මා කාමරයෙන් පැන යන ලෙස ඇඟවීමට උත්සාහ කළෙමි. නමුත් මාහට වැඩි දුර යා හත නොහැකි විය මාව අත්අ  ඩංගුවට පත් වීමි.

 මගේ හිස පහත් කෙරුණ අතර ධන හිස් නමාගෙන යා නොහැකි බව හැඟවීමට සහ  ගැලවීමට   හැකි වනසේ  දැඟලුවෙමි. කෙසේ හෝ  මා ගිලන් රථයට නන්වා

ඔවුන් මා ජීව බුබුලක රැඳවීය .එය සිදුකලේ අනෙකුන්ගේ ආරක්ෂාවටය. ඔවුන් මගෙන් තදින් ප්‍රශ්න කරන ලදී. ඔබ කොහේයන්නද සූදානම් වූයේ?

මම කිව්වේ ඕගොල්ලන් එක්ක එන්න මම කැමති නෑ මට ඕනේ ස්වභාවිකව මෙම තත්ත්වය නැති කරගන්න යැයි පැවසීම්මි නමුත් ඔවුන් එය පිළිගත් බවක් නොපෙන්විය .

''හරි ඔබ කියන්නේ අපිට අකමැති නිසා ඔබ පැණ යන්න හැදුවා. එහෙමද ? ''

''ඔව් .......''

''ඒක ඇත්ත ආවෙ හරියට මා මරන්න වගේ නේ ........''මම පැවසීම්''

බොරුවට මා අකමැති බව හැඟීමට උපරිම රංගනයේ යෙදෙන මා ඉදිරියට ආ පුද්ගලයා දු අම්මෝ කියවිණි ඒ ආවේ වෛද්‍ය ප්‍රතිකාර හැර දේශීය වෛදි ක්‍රම භාවිතා කරන ලෙස සුව කරන වෛද්‍ය සුවේයෙන් මහතාය මා ඔහු දුටුමා බිය වූයේ ඔහු දැඩි ක්‍රම භාවිතා කරන බැවිනි.

''හරි ඕනේ දේශීය ක්‍රම මගින් හොඳ කරන්නේ ''

''හරි මම කරන්නම්. ''

අමුතු හඬකින් හිනා වෙමින් පැවසීය දැන් නම් මං ඉවරයි මටම සිතිණි නමුත් පැය දෙකක් යන්නත් පෙර ඇගේ පලු මතුවිය මා රැගෙන අනිරෝධායන මධ්‍යස්ථානයේදී රොබෝ වෙක් මගින් පරීක්ෂා කිරීමට උඩුකය නිරාවරණය කරන ලදී මගේ ශරීරය පුරාම රතු පා ට පැල්ලම් සමූහය කී මා අසු නොවී බේරීමට සැනසීමක් විය මා නිරෝධායන්ට ලක් නොකළ යුතු අතර බෝවන රෝගයේ නොවන නිසා අවශ්‍ය ප්‍රතිකාර වෙත යොමු කරන ලදී මේ කෙසේ වූවාදැයි මට මෙන්ම ඔවුනටද පුදුමයි

අනපේක්ෂිතව මා වෙත ලැබූ පණිවිඩයෙන් මා සසල විය එනම් මා සමඟ රැකියාව කළ සියලු දෙනාම ඒ වන විට ජීවිතයෙන් සමුගෙන තිබීම මට බරපතළ ප්‍රශ්න අර්ථයක් ඉටු කර ඇත

සත්ත්වංශයට කුමක් වීදැයි දැනගැනීමට මා උත්සාහ කළෙමි. සත්ත්වංශය මුළුමනින්ම විනාශ වී ඇත ඒ නිසා ඔවුන් මහත් කලබලයෙන් සිටි ඔවුන් සැගවූ කැමරාවක මාගේ අපැහැදිලි ඡායාරූපයක් සටහන්වී තිබූ අතර එය හදුනා ගැනීමට සෑහෙන උත්සහයක නිරතවීය නමුත් ඔවුන් රූපය විශාල කරමින් හඳුනාගැනීමට සැලකිලිමත් වන ආකාරය මා දුටිමි

සතියක් යන්නටත් පෙර මා සුවපත් වූයෙමි. සුවපත් වන තෙක් මා මධ්‍යස්ථානයෙන් එළියට නොයැවීමට කටයුතු කරන ලදී. නමුත් සුව වූ මා කෙලින්ම කැඳවූයේ අධ්‍යස්ථානය වෙතයි.

‘‘අපි ඔබේ උදව්වක් බලාපොරොත්ත වෙනවා ඉක්මනින් මේ විනාශය කරපුකෙනා හොයලා දෙන්න‘‘ හැකි ඉක්මනින් යැයි පැවැසිය‘‘

මට මගේම බොඳ වූ ඡායාරූපයක් පෙන්වමින් පැවසීය

‘‘ කොහොමද මේ පුරේජ් එකම හොයන්නේ.‘‘ මා මගෙන්ම විමසීමි

‘‘ඇයි මට මේක කියන්නේ මම පැවසුවෙමි.

‘‘ඔබ මේ ආයතන බැඳීමට පෙර මේ වගේ දේවල් සම්බන්ධව කටයුතු කරලා ඇති නිසා ඔබ තමයි මේකට සුදුසුයි. ‘‘

‘‘හොඳයි මම උපරිම උත්සහයක් ගන්නම්.මා පැවසීමි‘‘

දැන් මේකට සැලසුමක් සැකසිය යුතුයි. මා නවාතැනට සෑහෙන දිනකට පසු ආවෙමි. මා නැති අතර එය කීපවරක්ම පරීක්ෂා කර ඇති බව ඇතුලට පිවිසී මට පසක් විය. මා මුලින්ම සිදු කරනු ලැබුවේ කැමරා සඟවා ඇතිදැය පරික්ෂා කිරීමය. සෑම අස්සක් මුල්ලක් නෑරය මට පරික්ෂා කිරීම කැමරා දෙකක් හමු විය. මා හිතුවට වඩා වැඩේ දරුණුය. කෙසේ හෝ කැමරාවලට හසු නොවන සේ මගේ වැඩ කටයුතු අනුව මා ද ඔවුනට හසු නොවන ලෙසත් මගේ මියගිය සගයා හසු කිරීමට සැලසුමක් සෑදුවෙමි.

ඩීඑන්ඒ විනාශ කිරීම පිළිබඳ ඉතා වැදගත් තොරතුරු අනාවරණය වූ බව ඔවුන් පැවසීය. එම ක්ලෝනීකරණය සඳහා බිලියන ගණන් මුදල් වැය කර තිබූ අතර ඇති වූ විනාශය  අති  මහත්තය මේ පිළිබඳ දිගින් දිගටම සාක්ෂි කැඳවීය.  තොරතුරු මකා  දැමීම නිසා ඇඟිලි සලකුණ ද නොතිබූ නිසා ගැටලු සහගත බව තවදුරටත් උග්‍ර වී ඇත . නමුත් දිගින් දිගට මේ පිළිබඳ විවිධ මාර්ග ඔස්සේ විමර්ශන කටයුතු ආයතන මගින් සිදු කරන ලදී .

නමුත් එම පර්යේෂණ තුළින් ගත් නිගමන වැරදි බව ඔවුන් මට දැන්වීය. නමුත් මා මෙවර සාර්ථක විය. මගේ සගයා අපේ ප්‍රොෆෙසර්ගේ ටීම් එකේ. මාත් සමඟ වැඩ කළ ඩේමියන් මා හසු කළෙමි. නමුත් එය ඔවුනට පිළිගැනීමට සිදුවේ. ඔවුන් මේ වන විට ජීවතුන්  අතර නොමැති වීමයි. කෙසේ හෝ සිදු විශාල පාඩු පිළිබඳ තවදුරටත් කතාබහ ඇති විය. එය නම් කළේ අනාගත විද්‍යාවේ පුනරුදේ විනාශ කිරීමක් වශයෙනි. නමුත් මගේ පොරොන්දු ඉටුකළෙමි. මම ප්‍රොෆෙසර්ට උපරිම සාධාරණය සහ අයිස් පයි ආයතනයට මා වෙත තැබූ විශ්වාසය මම තහවුරු කරමින් මගේ කටයුතු සිදු කලෙමි.  මාගේ කාලය ගිවිසුමට අනුව අවසන් බැවින් කොන්ත්‍රාත්තුව මින් ඉදිරියට අවලංගු වීම වඩාත් වැදගත්  වීය .

මා මගේ කාර්යය කළ බව පැවසීමට  අප ආයතනය වෙත පිවිසුනෙමි.  මාව ඉතා ඉහලින් අගය කල ඔවුන් මට මාස හයක දිගු නිවාඩුවක් අනුමත කරන ලදී . එය වෙන රටක ගත කරන ලෙසත්  දැනුම් දෙන ලදී  . ඔවුන්ගේ ප්‍රශංසා නිසා මා දැඩි සතුටට පත් කරන ලදී .

මා සතුටින් එම කාලය ගත කලෙමී  මාස හයක් ගතකර මා නැවත පැමිණියේ නව ජීවිතයක් ගත කිරීමේ සියලු සිහින යථාර්ථයක් කර ගනීමේ පරමාර්ථයෙනී. මා ගත වූ මාස හය තුලදී  සෑම දිනකම රාත්‍රී සිදු කලේ නව ජීවිතයක් ගත කිරීමේ සැලසුම් සැකසීමයි .

ඔත්තු කරුවකු ලෙස මාගේ ජීවිතයේ සෑහෙන කාලයක් මා ගත කලෙමී. විවිධ වූ අවධානම් අවස්ථා සඳහා නොබියව මුහුණ දුන්නෙමි. දැන් ඉතින් අවධානම්

කාර්යයන් ගෙන් ඉවත්වී නව නිදහස් විවෘත ජීවිතයක් ගතකිරීම මගේ ඒ කායන පර්මාර්තය විය මේ සඳහා සියලු සැලසුම් මා සතුවිය .

මා මගේ පැමිණීම දන්වා ස්තූතිය පිරිනැමීමේ ලිපිය බාර දෙන ලද." මා සතුටු සිතින් මගේ නවාතැන වෙත පැමිණියෙමි මා සතු සියයල්ල විකුණා නව නිස්කලංක පරිසරයක පදිංචිය තහවුරු කර ගතිමි .

දින සති ගත විය අද මා සිටින මේ පරිසරය ඉතා චමත්කාර එකක් විය. එය අක්කර හයකට කිට්ටු පොල් වත්තක් වන අතර එයට මායිම්ව මුහුදු සීමාවක්ද විය මෙවන් තැනක් ලැබීම මා ලද භාග්‍ය කී. පිටත පෙනෙන ලෙස ඉතා අලංකාර වීදුරු යොදා නිවස නිම කලෙමි . මේ සඳහා මාස අටක කාලයක් ගත කලෙමි මා මගේ ස්තාවරත්වය සාදා ගතිමි .

මෙම ස්ථානය අනාගතයේ ප්‍රසිද්ධ ස්ථානයක් බවට පත්වන බව මනසින් විඳිමින් සතුටු සිතින් කාලය ගෙව්වෙමි එමෙන්ම මාගේ අත්දැකීම් ගොනුවක් සේ සකස් කිරීමට ද මුල පිරුවෙමි.

වසර තුනකුත්මාස දෙකකුත් ගත විය. මා නිදහසේ වෙරලේ සෙල්ලම් කිරීම විනෝදාංශය කර ගතිමි. මා අදත් යා යුතු කැමතිම දසුන වෙරලේ සෙල්ලම් කිරීමයි . උදේසිට වෙහෙසුන මා සවස් වනතුරු නොඉවසිල්ලෙන් සිටියෙමි සවස් යාමේ වෙරලේ සෙල්ලම්කලේ අද වෙරල දැක්කාක් මෙනි. මා නිවසට එනවිට ටයි පටි පැලඳි දෙදෙනකු මිදුලේ විය. අති සුඛෝපභෝගී වාහනයකුත් විය ඔවුන් මා අත උපකරණයක් තැබීය එය මාගේ වම් අතේ ඔර්ලෝසුවක් සේ රැඳිනී එය හොලෝග්‍රෑම් එකක් විය .

ඉන් මතුවූයේ ප්‍රොෆෙසය . ඔහු මා හට පණිවිඩයක් එවා ඔහු හමුවීමට පැමිණෙන ලෙස දැන්විය. ලමා කුමක් කරම් දැයි මා කල්පනා කරන්නට විය .

මා කිසිවක් සිතීමටත් පෙර ඔවුන් මා රථයට ඔබා ගන්නා ලදි . මා දිග සුසුමක් හෙලීමි මෙයින්මට ගැලවීමක් නම් නැත . මන්ද මා ඔත්තු කරුවකු බැවිණි.

නිමි .

# පසුවදන.

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-768-9



මංජුලා කුමාරි  හපුහින්න මහනුවර මහාමායා බාලිකා විදුහලේ ආදී ශිෂ්‍යාවකි .ඇය වර්තමානයේ මහනුවර ශාන්ත සිල්වෙස්තර විදුහලේ සහකාර විදුහල්පතිනියක් වශයෙන් සේවය කරයි, ඇය පාසල්කාලයේ මෙන්ම වර්තමානයේ ද  ලේඛන කළාවට මහත්සේ ආදරය කරන අතර මහාමායා බාලිකා විදුහලේ ගත්කතුවර වැඩසටහන සඳහා ඇය රචනා කරන දෙවන ග්‍රන්ථය මෙම පොතයි .